රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2005 (V)

මගේ අංකය : EST/7/04/INS/1010
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.11.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධරයන් සඳහා වූ නව රක්‍ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම(අග්‍රහාර)

2005.05.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එහි ඇමුණුම (I) හි I වන හා II වන කොටස් 2015.12.01 දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත පරිදි සංශෝධනය කෙරේ. ඒ අනුව 2015.12.01 දිනෙන් පසු සිද්ධි සම්බන්ධයෙන් අග්‍රහාර රක්‍ෂණ ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ දී සංශෝධිත සීමාවන් අදාළ වේ.

**ඇමුණුම (I)**

**I කොටස - වෛද්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය**

| | ප්‍රතිලාභ වර්ගය | සීමාව |
|---|---|---|
| 01 | රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු | රු.30,000.00<br>(දිනකට කාමර ගාස්තුව රු.3,000/- බැගින්) |
| 02 | උපදේශක විශේෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ මත ලබා දෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වැයවන වෛද්‍ය සහ ශල්‍යකර්ම සඳහා ශල්‍ය හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු | රු. 50, 000.00<br>(පවුල් ඒකකයක් සඳහා) |

| | | |
|---|---|---|
| 03 | පිළිගත් වෛද්‍යවරයකුගේ හෝ වෛද්‍ය සේවා ආඥා පනතේ 41 යටතේ ලියාපදිංචි කළ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත ආරෝග්‍යශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේ දී වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සඳහා ගාස්තු | රු. 20,000.00<br>(පවුල් ඒකකයක් සඳහා) |
| 04 | සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ඇතුළත් විශේෂඥ සේවා ගාස්තු | රු. 20,000.00<br>(පවුල් ඒකකයක් සඳහා) |
| 05 | ඉහත 01 සිට 04 දක්වා ප්‍රතිලාභ හිමි පුද්ගලයකුගේ හදිසි රෝගාබාධයක දී ජීවිතය බේරා ගැනීම සඳහා පදිංචි ස්ථානයේ සිට ළඟම ආරෝග්‍යශාලාවට හෝ සාත්තු නිවාසයට ගෙනයාමට සිදු වූවහොත් ගමන් ගාස්තු | රු. 1,500.00<br>(පවුල් ඒකකයක් සඳහා) |
| 06 | ඉහත සඳහන් අංක 01 සිට 05 දක්වා සිද්ධීන් වෙනුවෙන්<br>(අ) එක් සිද්ධියක් සඳහා උපරිමය<br>(ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය | <br>රු. 120,000.00<br>රු. 150,000.00<br>(කලත්‍රයා ද රාජ්‍ය සේවයේ යෙදීසිටින්නේ නම් දෙදෙනාටම රු.300,000.00 ක ප්‍රතිලාභ හිමි වේ.) |
| 07 | සාමාජිකයන් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස්කණ්නාඩි ලබා ගැනීම. | රු.3,500.00 |
| 08 | රජයේ රෝහලක හෝ ආයුර්වේද රෝහලක වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන්. | රු.5,000.00<br>(දිනකට රු. 500/- බැගින්) |

| | | |
|---|---|---|
| 09 | I) සාමාන්‍ය දරු උපතක දී හෝ ස්වාභාවික ගබ්සාවීමක දී පෞද්ගලික රෝහලක නේවාසිකව සිටින්නේ නම් - ජීවිත කාලයටම දෙවරක් (උපරිම)<br><br>II) සාමාන්‍ය දරු උපතක දී හෝ ස්වාභාවික ගබ්සාවීමක දී රජයේ රෝහලක නේවාසිකව සිටින්නේ නම් ජීවිත කාලයටම දෙවරක් (උපරිම)<br><br>II) සිසේරියන් දරු උපතක් සම්බන්ධයෙන් පෞද්ගලික රෝහලකට ඇතුලත් කර තිබේ නම් - ජීවිත කාලය තුළ උපරිමය අවස්ථා දෙකකට යටත්ව | දිනකට රු.2,000/- බැගින් දින 5 ක උපරිමයක් සඳහා<br><br>දිනකට රු.500/- බැගින් දින 5 ක උපරිමයක් සඳහා<br><br>රු.40,000.00 |
| 10 | I. සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීම ( උපරිමය)<br><br>1. Heart Attack – (Myocardial Refraction)<br>2. Coronary Artery Disease (Coronary by – pass Surgery)<br>3. Stroke (Cerebra Vascular accident)<br>4. Double(Mitral & Aortic)Value Replacement<br>5. Atrial Septal Defect<br>6. Percutancous Transluminial Cororany Angioplast (PTC)<br>7. Fallot Tetrology<br>8. Bruganda Syndrome<br>9. Implanting Pacemaker – Single<br>10. Implanting Pacemaker – Double<br>11. Mitral Valve Replacement<br><br>II. RF Ablation - සාමාජිකයන් සඳහා පමණයි (උපරිම) | රු.500,000.00<br><br>රු.225,000.00 |

| | | |
|---|---|---|
| | III.<br>(අ) සාමාජිකයන් සඳහා පමණක් පහත සඳහන් ශල්‍යකර්ම සඳහා<br>1. Cancer<br>2. Kidney Transplant<br>(ආ) සාමාජිකයන් සඳහා පමණක් පහත සඳහන් ශල්‍යකර්ම සඳහා<br>3. Reanal Failure<br>4. Major Organ Transplant, such as lung or bone marrow, However this benefit will not be paid to a donor of a major organ<br>5. Paralysis<br>6. Multiple Sclerosis<br>7. Primary pulmonary Arterial Hypertension<br>8. Fulminate Hepatitis<br>IV. හෘදය පිළිබඳ ශල්‍යකර්ම වියදම් ප්‍රතිපූර්ණය කිරීම - පවුලේ සාමාජිකයන් සඳහා | රු.200,000.00<br><br><br><br>රු.150,000.00<br><br><br><br><br><br><br><br>රු.100,000.00 |
| 11 | ශ්‍රවණ ආධාර - පවුලේ සාමාජිකයන් සඳහා | රු.50,000.00 |

<u>පවුල් ඒකකය</u>

විවාහක සාමාජිකයන් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21 ට අඩු දරුවන් සහ අවුරුදු 21 ඉක්ම වූවද මුළුමනින්ම ආබාධ වූ අවිවාහක හා සේවා වියුක්ත ළමුන්

අවිවාහක සාමාජිකයන් :- සාමාජිකයා සහ වයස අවු.70 ට අඩු සාමාජික නිලධරයාගේ දෙමාපියන්

**II වන කොටස**

**<u>පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්‍ෂණාවරණය</u>**

රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් හිමි සියලුම සාමාජිකයන් පැය 24 පුරාම මෙම රක්‍ෂණ ක්‍රමයෙන් ආවරණය වේ.

**ලැබෙන ප්‍රතිලාභ**

I රක්‍ෂණාවරණය - දවසේ පැය 24 පුරාම

II උපරිම වයස් සීමාව - අවුරුදු 60 දක්වා

III රක්‍ෂිත මුදල - රු. 600,000.00
හදිසි අනතුරකින් මරණය සිදුවුවහොත් හෝ පූර්ණ අකර්මණ්‍යතාවකට පත්වුවහොත් හෝ රක්‍ෂිත මුදල යැපෙන්නන් අතර බෙදනු ලැබේ.

IV ගෙවනු ලබන මුදල - රු. 600,000.00

**අ. ස්ථිර අකර්මණ්‍යතාව**

| | |
|---|---|
| හදිසි අනතුර නිසා සිදුවන මරණයක දී හෝ ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවකදී | සම්පූර්ණ රක්‍ෂිත මුදල |

**ආ. ස්ථිර අර්ධ අකර්මණ්‍යතාව**

| | |
|---|---|
| එක් පාදයක් අහිමි වීම, එක් ඇසක් අහිමි විම එක් අතක් අහිමි වීම | රක්‍ෂිත මුදලින් 50% ක් |

**ඇ. තාවකාලික පූර්ණ අකර්මණ්‍යතාව**

| | |
|---|---|
| සති පනස් දෙකක (52) කාලයක් සඳහා | සතියකට රු. 500/-ක් බැගින් |

**ඈ. තාවකාලික අර්ධ අකර්මණ්‍යතාව**

සති පනස් දෙකක (52) කාලයක් සඳහා } සතියකට රු. 300/-ක් බැගින්

**ඉ. ස්වාභාවික මරණයක් සඳහා** } රු. 150,000.00

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශය